ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම 2023 වර්ෂය

බත්තරමුල්ල, කොස්වත්ත පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වන මගනැගුම මහමැදුර හා සෙත්සිරිපාය සංකීර්ණය වෙත පහත සඳහන් මාර්ග ඔස්සේ රාජකාරි දිනවල උදේ සවස කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමට 2015 වර්ෂය හෝ ඊට පසු වර්ෂවල නිෂ්පාදිත බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් වසර දෙකක් සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| බස් මාර්ගය | ලංසු ඇපකරය |
|---|---|
| අගලවත්තෙන් ගමන් ආරම්භ කර දොඩංගොඩ පිවිසුමෙහි මගින් සමග අධිවේගී මාර්ගය ඔස්සේ කොට්ටාව හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 67) | 230,000.00 |
| බුලත්සිංහලින් ගමන් ආරම්භකර ගැලනිගම පිවිසුමෙහි මගින් සමග අධිවේගී මාර්ගය ඔස්සේ කොට්ටාව හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 60) | 230,000.00 |
| කොච්චිකඩේ සිට ගමන් ආරම්භකර මීගමුව - ජාඇල පිවිසුමෙහි මගින් සමග අධිවේගී මාර්ගය ඔස්සේ පෑලියගොඩ, බත්තරමුල්ල හරහා මගනැගුම මහමැදුර දක්වා (කි.මී. 55) | 230,000.00 |
| අවිස්සාවේල්ල සිට පරණ පාර ඔස්සේ කඩුවෙල හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 47) | 230,000.00 |
| පාදුක්ක සිට ගොඩගම, මාළඹේ හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 27) | 165,000.00 |
| හොරණින් ගමන් ආරම්භ කර පොල්ගස්ඕවිට - කොට්ටාව - පන්නිපිටිය හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 42) | 230,000.00 |
| කළුතර සිට රත්මලාන, අත්තිඩිය, මිරිහාන, පිටකෝට්ටේ හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 48) | 230,000.00 |
| බණ්ඩාරගම සිට කැස්බෑව, කොට්ටාව හරහා බත්තරමුල්ල (කි.මී. 33) | 165,000.00 |
| කිරිඳිවෙල සිට පූගොඩ, දොම්පෙ, මල්වාන, බණ්ඩාරවත්ත, කඩුවෙල හරහා බත්තරමුල්ල (කි.මී. 45) | 230,000.00 |
| අළුත්ගමින් ගමන් ආරම්භ කර වැලිපැන්න පිවිසුමෙහි මගින් සමග අධිවේගී මාර්ගය ඔස්සේ කොට්ටාව හරහා බත්තරමුල්ල දක්වා (කි.මී. 75) | 230,000.00 |

ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි.

ලංසු කැඳවීම ජාතික තරඟකාරිත්ව ලංසු පටිපාටිය අනුව සිදුකරනු ඇත.

ලංසුව, ලංසු කැඳවීමේ අවසන් දිනය සිට දින 91ක් වලංගු විය යුතුය.

ලංසු ආරක්ෂණයත් සමඟ **(2023.10.09 දක්වා වලංගු)** ලංසු ඉදිරිපත් කළ යුතුය. ලංසු ආරක්ෂණක් නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2023.04.28 දින** සිට **2023.05.19** දින දක්වා එක් ලංසු පතක් සඳහා ආපසු නොගෙවනු ලබන **රු. 3,450.00** (වැට් සහිත) මුදල, **අධ්‍යක්ෂ ජනරාල් මාර්ග සංවර්ධන අධිකාරිය නමට ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ගිණුම් අංක 0000001943** ට ගෙවා **අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මගනැගුම මහමැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අදාල ලංසු පත් ලබා ගත හැක. ලංසු ලේඛණ මිලදිගන්නා විට ගෙවීම් පත්‍රිකාවේ මුල් පිටපත ඉදිරිපත් කල යුතුය. 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුව, ටෙන්ඩර් ලබා ගැනිමට සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතුය.

මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත සහ තවත් පිටපතක් ආයතනයේ හෝ ව්‍යාපාරය ලියාපදිංචි කල සහතික වල නීත්‍යානුකූල ලිපි ලේඛණ වල පිටපත් සමග **2023.05.22 දින ප.ව. 2.00 ට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, පළමු මහල, මගනැගුම මහමැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරෙහි **" මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් පත් කැඳවීම - 2023 වර්ෂය ………………………………… (අදාල මාර්ගය සඳහන් කල යුතුය)** යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

**ලංසු භාර ගැනිම අවසන් වු වහාම ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මගනැගුම මහමැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල කාර්යාලයේදි ලංසු විවෘත කරනු ඇත. ලංසු කරුවන් හෝ ඔවුන්ගේ බළයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**වැඩි විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 0112884790 ඔස්සේ අධ්‍යක්ෂ ප්‍රසම්පාදන මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.**

සභාපති
මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව
මාර්ග සංවර්ධන අධිකාරිය,
පළමු මහල, "මගනැගුම මහමැදුර",
අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල